

# සකුරා

## CHAPTER 01

SEHARA ARUNODYA FERNANDO

# පිදුම

ජීවිතය නම් වූ යුධ බිමෙහි
වර්තමානය නම් වූ
පළිහට මුවා වී
අනාගතය නම් වූ
ත්‍රස්තවාදියාට එදිරිව
අතීතය නම් වූ
අසිපත ඔසවන
සමුරායිවරුන් හට
සෙනෙහසින් පුද කරමි



# පෙරවදන

ටෝකියෝවේ ලස්සනම කාලෙ තමයි වසන්ත කාලෙ කියන්නෙ
ඉතින් මේ කාලෙට ටෝකියෝව කියන්නෙම භාවනාවක්.
හැමෝම කියන විදියට නම් ඒ ලස්සනේ ඇත්තම අයිතිය තියෙන්නෙ
පුංචිම පුංචි රෝස පාට මලකට. ඉතින් ඒ මලේ නම තමයි

**සකුරා**

කියලා කියන්නේ. ගොඩක් අය හිතන්නේ මේ සකුරා පිපෙන්නෙම
මිනිස්සුන්ගෙ ජීවිත වලට වසන්තය අරගෙන කියලා.
ඒ නිසාමද කොහෙදෝ ළං කරගන්න කොච්චර අමාරු උනත්
ලෝකෙ පුරාම හදවත් සකුරා වලට මෙච්චරටම ආදරේ කරන්නේ.

**ඒත්....**

සකුරා අපිට ඇත්තටම වසන්තය ගේනව කියලා ඔයාලත් හිතනවද?
සකුරා ඇත්තටම අපිව සතුටු කරනවද?
නැත්තම් අපිව රවට්ටනවද?

ඉතින් ඒ තීරණේ ඔයාලටම බාර කරල මම මෙතනින් නවතින්නම්

හැබැයි එක දෙයක්...
ඔයාලා හිතපු ටෝකියෝවයි මම කියපු ටෝකියෝවයි,
ඔයාලා හිතපු සකුරා මලයි මම කියපු සකුරා මලයි,
සමහරවිට දෙකක් වෙන්නත් පුළුවන් ....

සෙහාර අරුණෝදය

මේ කතාව පටන් ගද්දිම මට හිතුනා ඔයාලට මේ කතාවේ ඉන්න සමුරායි ගැන කියල හිටියොත් හොඳයි කියලා. මෙයාව ටෝකියෝවේ නම් නොදන්න කෙනෙක් නැති තරම්. මේ සමුරායි ඕන තරම් සටන් වලට මුහුණ දීල තියනව. ඒ වගේම ඒ සටන් ගොඩක් දිනන්න ප්‍රධානම හේතුවක් වුණෙත් මෙයාගෙ මේ දක්ෂ සටන් ශිල්පයම තමයි.  අසිපත් හරඹය කිව්වොත් නම් මෙයාගෙ නම තමයි හැමෝටම වගේ ඉස්සෙල්ලම මතක් වුණේ. ඒකට හේතුව වුණේ මෙයා දක්ෂ අසිපත් හසුරවන්නෙක් වුණ එක.

දවසක් මෙයාට හම්බවෙනව ටිකක් පරණ ලොකු හයියක් තිබුණෙ නැති අසිපතක්. ඇත්තම කිව්වොත් මේ අසිපත මේ වෙද්දිත් කෑලි වලට වෙන් වෙන්නම වගේ විනාශ වෙලා තිබුණෙ. ඒත් මොකක්දෝ මන්දා අමුතු සලකුණක් මේකෙ එක තැනක හරි ලස්සනට හීරීමක්වත් නැතුව තිබුණා. ඇත්තටම සමුරායිට මේ මොකද්ද කියන එක ගැන නම් ලොකු දැනීමක් තිබුණෙ නෑ.

කොහොම හරි මෙයා තීරණය කරනවා මේ අසිපතේ කැඩුණු කොටස් ටික ආපහු සැරයක් එකතු කරල මේ අසිපත හදන්න ඕනෙ කියලා. එයා එයාගෙ කම්මලට ගිහිල්ලා එයාගෙ ආයුධ වලින් ආයෙමත් මේ අසිපත තිබුණ විදියටත් වඩා හොඳට හදලා ඉවරකළා හැබැයි ඊට පස්සෙ සිද්ද වුණ දේ නම් මෙයාට හිතා ගන්නවත් බැරිවුණා.

# බිඳුණු අසිපත

යුධ බිමක ලේවිලක් මැද වැටි තිබී හමු වූ          අසිපත
සිඳී ගිය තුඩ බිඳී ගිය බඳ පවසාවි යුධ වල          බිය
සාම ගිවිසුම තබා අත්සත් දැමුවාට බිම          ආයුධ
විලක් නැති බව කවුරු කිව්ද යළි සදන්නෙම්          අසිපත

මයිනාහම ගිණියම් වෙලා රෑ මැදියමේ දියෑ කරා          යකඩ
කිණිහිරය මත ඇඳි රටා අසිපත හදයි මුවහත          ආයෙම
සිව්මත්ම ලෝහයෙන් තැනුවෙමි අසිපතේ බිඳී ගිය          බඳ
පිළිසකර කර නැවත සැදුවෙමි පෙරට වැඩියෙන්          සිව්යට

පිළිසකර කර සදා සිටියත් අහිමි බව මේ          අසිපත
නිතර සිහියට ගෙන දෝව් මේ අසිපතේ වූ          කැටයම
අයිතිකරු යළි සොයා යන්නට වෙර දරණ බව          රහසෙම
වැටහෙන්න ඇති බිඳී ඇති බව මෙහිම මුල් හිමිකරු          වෙත

අත් හරින්නට ලොබ බැඳෙන මෙන් සදා නිමකළ          අසිපත
සිව්ය ලද පසු හිමිකරුට යළි අවනතයි එය ලොව්          දම
වැටුණු දහඩිය පිළිස්සුණු තැන් නොදන්නා මේ          අසිපත
මයිනාහම කිණිහිරයටත් බැන යන්න යයි හිමිකරු          වෙත

ඇසිපතට සිද්ද වුණ දෙයින් පස්සෙ මෙයාට ලොකු කලකිරීමක් ඇති වෙලා තිබුණා. එයාගෙ මහන්සිය එයාගෙ කැපකිරීම මේ හැම දෙයක්ම අපතේ ගියා වගේ අදහසක් එයාගෙ හිතට දැණුනා. මේ එපා වෙච්ච සිතුවිල්ලත් එක්ක එයා ටිකක් ඇවිදින්න යන්න තීරණය කරන්නෙ අඩුම තරමෙ සොබාදහමෙන් හරි එයාට සැනසීමක් ලැබෙයි කියලා හිතලා.

මේ විදියට ටිකක් ඉස්සරහට යද්දි එයාට හම්බවුණා ටෝකියෝවෙ තියන ලස්සනම නිස්කලංකම උද්‍යානයක්. මේ තැන අපේ සමුරායිට නම් නුපුරුදු තැනක් වුණේ නෑ. මොකද හැම යුද්ධයකටම වගේ පස්සෙ එයා මේ තැනට එන්න පුරුදු වෙලා හිටියා. කොහොම හරි එයා මේ උද්‍යානය ඇතුලෙ නිදහසේ ඉන්න පුලුවන් තැනක් හොයාගෙන යන්න පටං ගත්තා.

ඇත්තටම ඉතින් ලොකු වෙලාවක් යන්න කලින්ම එයාගෙ ඇස් දෙක මේ උද්‍යානෙ එහා අයිනටම වෙන්න තිබුණු බංකුවක් ගාව නතර වුණේ ඒ බංකුව එයාට ගොඩක් හුරු එකක් වුණ හින්දමයි.

# කෙළවරේ බංකුව

වියළි තුරුපත් සුළං සිඹ සිඹ බිම පතිත වනු      දුටුවෙමි
අඳුරු කරගෙන වට පිටාවම මහ වැස්සකට      සැරසුණි
පරවෙලා වැටි මල් දෙක තුනක් පුරුදු බංකුව      මතවුණි
පුරුදු විලසම මතට වී මම මල් වැටෙන හැටි      නරඹමි

ආදරෙන් මට අමතාපු මහ රුක් ලතා අද      මැලවිලා
ගීත ගැයූ මද සුළං රැල්ලත් මගෙන් ඈතට      විහිදිලා
සිනා සී සිටි වලාතිරය අන්ධකාරෙම      වැලඳිලා
එදා වාගෙම අදත් බංකුව මා වෙනුවෙනම්      සැරසිලා

බිඳුණු හදවත් වියළි තුරුපත් වාගේම දකිනා      නිසා
කඳුලු කැට වැහි බිංදු වාගෙම බංකුවට දැනෙනා      තුරා
සෝ සුසුම් උණුහුම් සුළඟ මෙන් ගල් මතට පිඹිනවා      සදා
බංකුවට මම අලුත් නැතුවැති නිතර කල් ගෙවි තැන      නිසා

මතකයම කළු ගලක් මත මම තබා යන්නෙමි      කළුවරේ
නිතර ඇවිලෙන රුධිර නහරය කපා දැමුවෙමි      මැදියමේ
කාටවත් කියවන්න බැරි ලෙස ලියා තැබුවෙමි      ජීවිතේ
දෙනෝදාහක කතා දන්නා කෙළවරේ ඇති      බංකුවේ



ඔය වගේ අපේ සමුරායි එයාගෙ පරණ මතකය
මේ බංකුව උඩදි අවුස්සන්න පටන් ගත්තා.
එයා මේ පරණ මතකය ඇතුලෙ එයාගෙම
ලෝකෙක ජීවත් වෙන්න පටන් ගත්තා.
එයාගෙම අතීතය ඇතුලෙ එයා විදවපු අවස්ථා
එකින් එක එයාට මතක් වෙන්න පටන් ගත්තා.
නොදැනුවත්වම එයාගෙ අතීතයෙ වැහිලා තිබුණු
වේදනාත්මක මතකයන් එකින් එක උඩට ආවා.
එයා යුද්ධ වලදි වගේම අනිත් තැන් වලදිත්
එයාගෙම සීමාවන් මගහැර ගත්තා කියලා
එයාට මේ වෙලාවෙ හිතෙන්න පටන් ගත්තා.

# මගහැරුණු සීමාව

අවතැන්ව සිටි මතක ගිණිමැල ආයෙමත් ගිණියම් වෙලා
පුරුදු තැනටම මටත් රහසෙම මාව අරගෙන දුර ගියා
කාත් කවුරුත් නොමැති කතරක අතරමැද්දේ සිර වෙලා
නිරුත්තර හදවතේ ගැඹුරේම නියතඩින් මම සිරුවා

සිදුරු වුණු තැන් වල පැලැස්තර ගැල්විලා බිම පතිත වී
ගලා යයි මතකයේ රස තැන් මටත් රහසෙම කිට්ටු වී
පුරුදු තැන නුපුරුදුම විදියට පෙනුණු හින්දා වෙනස් වී
යන්න අවසර පතා සිටියා මතකයෙන් මම දුරස් වී

මතකයම ගිණි දවාලන්නට නොහැකි හින්දා ක්ෂණයකින්
මතකයේ ගින්දරට හසුවී දැවෙනවා කාටත් හොරෙන්
අතරමැද ගිණි නිවන්නට ගිය නිසා සීමා පසු කරන්
නැතිව සීමාවක් දැවෙයි මම මතක අළු සෑයක් මතින්

ඔය වගේ මතකයන් එක්ක කාලය ගත කරද්දි
එයාට තේරුණා එයා එයාගෙම ජීවිතේ ගොඩාක්
ආපස්සට ගිහින් කියලා. එයා අසිපත අතට ගන්න කලින්
එයාගෙ ජීවිතේ වැහිල ගියපු
එක සුන්දර පරිච්ඡේදයක් වුණු තැනක එයා නැවතිලා හිටියා.
අසිපතට කලින් එයා එයාගෙ වචන වලින් මුලු ටෝකියෝවම
වසගයට පත් කරගත්තු කවිකාර ජීවිතෙන් එයාගෙ මුලු
මනසම වැහිල ගිහින් තිබුණා.
ඇත්තටම එයාට හිතෙන්න පටන් ගත්තා එයාගෙ ඒ
සුන්දර අතීතෙට මොකද වුණේ කියල. මේ සුන්දර
කවිකාරයගෙ ඉරණම විසඳුන විදිහ එයාට තවත්
ප්‍රශ්නාර්ථයක් වුණා.

# කවියෙකුගේ ඉරණම

නිවෙන තරුවල එළිය හොය හොය අඳුරේම යළි ගිලිලා
කෝපි උගුරට තාරකා එළි කියන මග ගැන අසාලා
මතක නැතිවම මහ පාන්ද්‍ර හීනෙකින් වගෙ ඇහැරිලා
සිහින අතරේ ලියපු කවි පද මැව් මැවී යළි සිහිවෙලා

දැනුන කවි පද ගිණුම් ගත කර ශේෂයම දෙසා බල බලා
කපා හැරිමුත් කියා බොල් ණය හර කරපු සමහර කතා
ගිණුම් ගත කළ පේළියක් අග පොලී මුදලක් ලියවිලා
තබා ගිණි මම වසා දැමුවෙමි කවි පිරුණු ගිණුමත් එදා

වැටුණු හුස්මට පවා ණය විය අන්තිමේ ඔහු කවි ලියා
කාත් කවුරුත් නොමැති කරුවල රැක පණට තිත තියා
ඔහුම ලියූ කවි පේළියක අග ඔහුගේම මතකය ඔතා
නතර කරලා තිබුණු හුස්මක් කවියෙ කෙලවර හමුවුණා

මේ මතකයන් එක්ක අපේ මේ සමුරායිට තේරුම් ගියා
එයා ඉස්සර ගොඩක් ආසාවෙන් කරපු දේවල් පවා
දැන් එයා අතෑරල දාලා ඉවරයි කියලා. ඒක හරියට
එයාට දැනුනෙ එයාගෙම ආත්මය එයා විසින්ම ඝාතනය
කළා වගේමයි. මේ ආත්ම ඝාතනය එයාව කාලයත් එක්ක
දක්ෂ රණශූරයෙක් කලත් එයාගෙ ඇතුලෙ හිටපු
සුන්දර මනුස්සයව ආයෙ පණ දෙන්න බැරි තරමටම
මරල දාලා ඉවරයි කියලා මේ සමුරායිට තේරුණා.

# ආත්ම ඝාතනය

වසන්තය එනතුරා ඉනිමං අයාගෙන මග බලා, සිටියා
මල් පිපුණු හැටියෙම් වලයක් හටගන්න තුරු බලා, සිටියා
තනිව යන මග කියා නොදැනී දැස් දල්වා බලා, සිටියා
නිවුණු පහණට එළිය එනතුරු ආත්මය මග බලා, සිටියා

පිපුණු කුසුමන් පරවෙනා බව අමතකව හිත රිදී තිබුණා
නියඟයේ දිය පොදක් සොයමින් ගම්දනව් පිරලා, තිබුණා
පායනා තුරු අමාවක සඳ සිතේ කහටක් රැඳී තිබුණා
ආත්මය ආත්මෙනම් බේරී කොහේදෝ සැඟවිලා, තිබුණා

මදුවිතක් ගැලුණා වාගේ හදවතම වෙරි වැටුණු අතරේ
පාළු මාවත හුදෙකලාවේ දුර ඇදෙණ මතකයන් අතරේ
සැඟවිලා සිටි ආත්මය මා සොයා ආ කල් වෙලා අතරේ
මරා දැමුවෙම් කාටවත් නොහැඟෙනා සිතුවමක් අතරේ

ඔය විදියට එයාගෙම මතකය එක්ක එයා සැහෙන වෙලාවක් මේ බංකුව උඩට වෙලා තනි වෙලා හිටියා. ටික ටික කරුවල වැටෙනවත් එක්කම එයාගෙ මනස එයා හිතුවටත් වඩා වේගයෙන් එයාගෙ ගැඹුරුම මතකයන් වලට ළං වුණා. මැදියම් රෑ කියන්නෙ කොහොමත් මතක වලට පණ එන වෙලාවක් කියන එක මේ පරණ කවිකාර හිතට නම් තේරුම් ගන්න ලොකු වෙලාවක් ගියෙ නෑ. මේ මායාකාරී මැදියම් රෑ එක්ක තනි වෙන්න එයාට ලොකු වෙලාවක් හිතන්න ඕන වුනෙත් නෑ. මොකද ඒ වෙද්දිත් මේ මැදියම් රෑ මහ කරුවල එයාව සම්පූර්ණයෙන්ම වගේ වහගෙන ඉවරයි.

ලුණා

# මැදියම් රෑ

තාරකා එළි දිලෙන සඳ වට වලාකුල් එතෙනා දිහා
හිඳී තවමත් බලා, ඒ දෙස පුරුදු බංකුව මතම මා
මඳ පවන ගත සිඹින විට කිති කැවෙයි හදවත ඇහැරිලා
නිදාගෙන උන් මතක පොත කිම මැදියමේ පිටු පෙරලිලා

හැඬන්නට බැරි කඳුළු පිණිකැට තිබේ මතකයෙ විසිරිලා
එකට එක් වී පසමිතුරු මෙන් මටම එරෙහිව නැගෙනවා
මැදියමේ තනිකමින් ගැලි වී හිනැහෙන්න පොර බදනවා
හිරු දකින පන්සල වගේ ගත ඇවිලෙනා බව පෙනෙනවා

කඳුළු සැඟවුණු දෑස් දෙතොලේ සිනහවක් දෙයි මවාලා
මලකුණක් වූ පණ ගැහෙන ගත අන්ධකාරයෙ ගිලීලා
දිව යාව දෑස අතේ සොයා සොයා ඇතේ එළියක් කියාලා
මතක පිටුවල අතරමැදකදි වාරු නැතිවෙයි නිවීලා

කව්කාර සිත පුබුදාවී මියගියපු මතකයෙ කඳුලැලි
දිලෙන තරු වල මතක සිතුවම් එකින් එක ඇඳිලා ඇති
හිරුට නැති ගී සඳුට කෙලෙසක ලියවුණිද මට වැටහුණි
මැදියමේ පණ ගැහෙන සිතුවිලි මාව අසරණ කරවී

මේ උද්‍යානය පුරාම ඇවිද ඇවිද තමන් එක්කම සටන්
කර කර හිටපු මේ සමුරායිට හිතුණා තවත් රෑ වෙනකම්
මේ උද්‍යානයේ ඉන්නෙ නැතුව එළියට ඇවිත් අනිත්
අය එක්ක කාලය ගතකරන්න ඕනෙ කියලා. ඉතින්
මේ අදහසත් එක්ක එයා එන්නෙ ටෝකියෝවෙ තියන
ලස්සන පරණ තානායමකට. මේ තානායම මෙයා
කාලෙකට කලින් ඉඳලම වගේ හොඳට දන්න කියන
එයාට හුරු මිනිස්සු ඉන්න තැනක්. කලින් එයාගෙ
අසිපත යුද්ධයක් අතර මැදදි විනාස වුණා. ඒ වෙලාවේ
මේ තානායම එයාට සෙවනක් වෙච්ච විදිය
එයාගෙ මතකයේ තිබුණා.
ඒ නිසාමයි එයා ආයෙමත් මේ තැනටම ආවේ.
ඒත් එයා හිතුවෙවත් නැති දෙයක් තමයි ඇත්තටම
මේ තානායමට නම් වෙලා තිබුණෙ.

# තානායම

කෙළවරක් නැති මඟක ඇවිදින විටදි හමු වූ නැවතුම
මහන්සිය ගිනි නිවාගන්නට පිහිට වූ මේ නැවතුම
රස පැණින් දිව පිනායන්නට උගුර තෙත්කළ නැවතුම
දෙණෝදාහක වෙහෙස නිවිවත් මතක කාටද නැවතුම

නැවතුමේ පුටු දිරාගිය මුත් කරයි සංග්‍රහ හැම්දින
සෙවිලි වහලය කැඩී සිදුරුව තෙමෙන මුත් මහ වැස්සට
හිඳියි තවමත් තෙමෙන තැන්වල තියා කුඩ ඇති මේසය
දිරාගෙන තව කරයි සංග්‍රහ බිඳී ගියෙ තානායම

යනෙන අය ගොඩ වෙලා තවමත් විඳියි සංග්‍රහ යහමින
නොදැනුනත් දිරලා ගියපු බව බිමට ඇතිරූ ළී ටික
කකුල් කැඩිලා පැද්දෙනා විට හැඟෙන මුත් වැටෙනා බය
වගක් නෑ කිසි කෙනෙක් හට මෙය යන්න යයි රැඳිලා හැම

තවම දැල්වේ කැඩුණු කුප්පිය කරුවලෙන් ගලවා රිය
බිත්ති ඉරි තැලි මුත් ජනේලය තවම ගෙන එයි මද නල
කතා කළමුත් ගමන ගැන අය නොකියාවි නැවතුම ගැන
උන්නු තැන හිඳ තවම සංග්‍රහ කරයි මේ තානායම

ලෂාලු

එයා බලාපොරොත්තු වුණු විදියට තානායම තිබුණෙ නැති වුණත්
කලින් වුණ දේවල් එක්ක මෙයාට මේ තානායම දාලා යන්න හිතුනෙ නෑ.
ඉතින් මෙයා මෙයාගෙ රාත්‍රි ආහාරය මෙතනින්ම ගන්න තීරණය කරන්නෙ
තානායමේ පෙනුම ගැන වැඩිය හිතන්නෙ නැතුව.
ඉතින් ඒ නිසා එයා ඉස්සර ගොඩක් ආස කරපු කෑමක් ඇණවුම් කලා.
හැබැයි කොච්චර ආසාවෙන් හිටියත් අන්තිමට ඒ කෑම එක එයාව
කේන්ති ගස්සපු එකයි වුණේ. මොකද කෝකියා අතින් මේ කෑම එකට
ලුණු ටිකක් වැඩි වෙලා තිබුණා. ඉතින් මේ කේන්තියට එයා කෑම එක අරගෙන
ආව සේවකයටත් බැනලා මේ තානායමෙන් එළියට ගියා.
එයාගෙ හිතේ අවුලයි කේන්තියයි නිවුනට පස්සෙ එයාටම
ලුණු ටිකක් වැඩි වුණ එකට කේන්ති ගත්ත එක වැරදි කියලා
තේරුම් යන්න පටන් ගත්තා.

# ලූණු

කුස්සියක මුලු ගැන්විලා, සැඟ විලා, සිටියත්      දවසම
ගිණි මෙල්විලා, ඇහැරෙද්දී ලිප කාට කාටත්      සිහිවුණා
දියවෙලා, යන හින්දාම නෑ කාටවත් ගානක්      වුණා
හැන්දිකටවත් නැතේ ගානක් නොපෙනිලා, යන ලූණු      වල

කොයි තරම් දිව පිනවනා රස බෙදුන් හැදුවද      අන්තිම
නොපෙනිලා, ගිය ලූණු වලට දුන්නාද කවුරුත්      නම්බුව
දැණුනෙ නැතුවත් වැඩිවු පසුනම් අඹරාව් තොල කට      සැම
හඬා වැලපෙන බවද නියතයි ඇසුණා නම් ලූණු      පොදකට

පහේ අඩුවක් තිබ්බ බව නම් හුස්ම ගද්දීම      තේරුණා
දිවෙන් අගවන මිරිස් රස නම් නෙතට කඳුලක්      ගෙනාවා
කොයිතරම් නී රස වුණත් අවසානයේ පිලියම්      යොදා,
රස කලත් කවදාකවත් ලූණු වලට ලැබුණාද      ප්‍රශංසා

ඉක්ම් වූ පසු මාත්‍රාවත් බොහො දෙනා දොස්      පවරන
අඩු වු ලූණු පමණකම් සිහිකර බැනවදියි රස      බෙදුනට
නොමැති තැන් වල බැන වැදුනමුත් ගිලිහිලා, ගිය      රසයට
තුනපහට ගුණ ගයපු තැන් වල සැඟවුණා ලූණු වල      රස

ශශාඞ



තානායමෙන් එළියට එනකොටත් හොඳටම රෑ වෙලා තිබුණු නිසා මේ සමුරායි කරුවලේම ටිකක් ඇවිදින්න හිතුවා. රෑට හමන මහන්සිය නිවෙන හුළඟත් එක්ක ඇත්තටම මේ සමුරායිට ලොකු නිදහසක් දැනුනා. ඒ නිදහසත් එක්ක එයා ඉබේටම වගේ ලොකු හුස්මක් එක්කම අහස දිහාවට හැරුනෙ ඒක ලොකු සැනසීමක් වෙයි කියලා හිතල වෙන්න ඇති. ටෝකියෝ රෑ අහසත් එක්ක ගොඩක් දේවල් බෙදාගන්න හිතන් අහස දිහාවට හැරුනට එයාගෙ ඇස් නතර වුණේ නම් එකම එක තරුවක් ළඟ. මොකක් හරි හින්දා මෙයා මේ තරුව දිහාම බලාගෙන හිටියෙ හරියට ගිණි කන්දක් වගේ එයාට වදයක් වුණු මතකයෙ මේ තරුව ගැනත් කොතනකදි හරි ලියවිලා තියනව වගේමයි.

# තනි තරුව

සැරිසරන්නට පෑව් කතරක රාත්‍රියෙ සඳ සොයය සොයා
ඉබාගාතේ මං සරද්දී තරුවකට ඇරයුම් කලා
දිලිසෙනා සඳ එළිය නැතිමුත් තරුව දැල්වෙමින් රෑ පුරා
රෑ අහසෙ සඳ නොමැති අඩුවත් නුඹෙන් සැගවා දිලිසුනා

අන්ධකාරෙම ඉකිගසන බව දුර ඈත තරුවට කියා
දැල්වෙන හිරු රැස් වලට බිය වී රාත්‍රිය එනතුරු බලා
බැස ගියපු සඳ නැවත නොඑනා විටදි තරුවම බල බලා
වැටුණු කඳුලැල් නොදැණ ඇති තව සඳ එළිය හිමි නෑ කියා

මිය ගියපු සඳ එළිය අරගෙන ඇවිල්ලා නුඹ ළඟාටම
දුබල ගිණියම් තරුව පාගා දිලෙන අහසේ නව සඳ
දැවී ප්‍රාණය අල්ප වූ තරු එළිය අඳුරෙන් යට විය
සඳෙහි එළියෙන් සැනසෙනා නුඹ තරුව විසිකර දැමුවද

සඳට වැසිලා තරුව නුඹගේ මානයෙන් දැණ් ගිලිහිලා
මාවතේ නුඹ යවා සිටියත් විපරමක් පසු නැහැ කියා
එරෙහි වෙන්නද නැවත යන්නද තරුව තනිවම සිත සිතා
එරෙහිවනු බැරි නිසා සඳකට තරුව රහසෙම සැඟවුණා

මේ තරුව දිහා බලාගෙනම මේ සමුරායි
එයාගෙ මතක පොතේ ගොඩක් පිටු
පෙරළල තිබුණා. ඒ මතක ආවර්ජනාව එයාට
කොච්චර ලොකු වේදනාවක් වුණත්
එයාට මේ ආවර්ජනාව නම් නවත්තගන්න
බැරිවුණා. එයා සතුටින් හිටපු කාලය
වගේම එයාගෙ ජීවිතේ නරකම කාලයත්
එයාට මැවිලා පේන්න පටං ගත්තා.
මේ හැම මතකයක්ම රාමුවෙන් රාමුව ගෙවිල
යනකන්ම මෙයා මේ ආවර්ජනාවට නම්
කිසිම බාධාවක් කළේ නෑ.

# ආවර්ජනා

කැලැන්ඩර් කොළ ගැලවිලා බිම සිඹිනවා හුස්මක් වගේ
මාස දින සති ගෙවිලා යනවා සිහිලැල් වූ සුළඟක් වගේ
මකුළු දැල් බිම කඩා වැටිලා අලුත් අවුරුදු දා වගේ
නමුදු මතකය ගර්ජනා දෙයි සැලොලයිඩ් පටයක් වගේ

රාමුවෙන් රාමුව ගෙවෙද්දී මතකයේ සිතුවම් පාට
මතක පිටු වල කඳුලු වැගිරෙයි දරන්නට බැරි උණුහුම
රෝස පෙති යහනාව පරදා සඳලූ තලයක තනි වුණ
සොයනවා මග සඟවන්න මේ අඳුරැවූ මිථ්‍යාවත

කිලිටි වුණ මතකයේ සටහන් සරසන්න මල්දම් වලින්
නටඹුන්වී ගිය සමරු සිතුවම් ඇඳේවී යළි පින්සලෙන්
සිහින සිතුවම් ගසාගෙන යයි මතකයේ සැඩ මාරුතෙන්
වාරු නැති සිත හඬා වැලපෙයි මතකයෙ ආවර්ජනාවෙන්

ඪි



මේ වෙද්දි ටිකෙන් ටික සමුරායි
අහස දිහා බලාගෙනම ඔහේ ඇවිද
ඇවිද ඉස්සරහට යද්දි පොඩි වැහි
පොදකුත් එකසැරෙම වගේ වැටෙන්න
පටන් ගත්තා. වැහි පොදත් එක්ක
එයාට මතක් වුණේ එයාගෙ ජීවිතේ
වුණු අහිම් වීම් ගැන. මේ අහිමවීම්
ගැන කල්පනා කර කර අහස දිහා
ආපහු බලද්දි තමයි එයාට මතක්
වුණේ අද අමාවක දවසක් කියල.

ඩී ෆ

# අමාවක

මතක පිටුවල කුරුටු ගෑ තැන් නිය තුඩින් කලතා යළි
අඳුරු අහසම ඉරිතලාගෙන කඳුළු වැහිකැට පතිත වී
සැඟවෙනා තරු වලාකුල් වල මොනවදෝ ලියනා වැනී
මගේ අහසම අඳුරු කර සඳ යාවිදෝ මාගෙන් මිදී

රිහැයි හඬ රෑ මැදියමේ තව තරුවලින් බැහැ මකන්න
පාළු අඳුරක මතක ලියවැල් ආකහේ තව ලියන්න
හදෙහි සිතුවම් තරු අතර වී තවත් පෙම් කවි ගයන්න
සඳ නොමැති රෑ සිත් අහසෙ නුඹ තරුවක්ව වී හිඳින්න

විකල් සිහියෙන් අහස පීරා සේව්වෙම නුඹ ගැන මය
සොයා සඳවත හති වැටුණු තැන වාඩි වී මඩ වගුරක
තරු වලින් හැමදාම විමසුවෙ සඳ කුමට සැඟවිලාද
පසුව සිහිවුණි අහම්බෙන් වගෙ අද අමාවක රෑ වග

ශීල

මේ අමාවක රෑයේ එයාට දැනුන තනිකමයි,
එයාගෙම අතීතය එක්ක කරන මේ යුද්ධයයි
එයාව ටිකෙන් ටික දුර්වල කරන්න පටං ගත්තා.
ඉතින්, මේ මතකයන් වල උඩම හිටියෙ
එයාගෙ පණ තරම් එයා ආදරය කරපු ගෑණු ළමයෙක්.
මේ මතකය මෙයා වැඩිපුරම බය දේවල් වලින්
එකක් වෙන්න හේතුව වුණේ මේ ගෑණු ළමය
මෙයාව ප්‍රතික්ෂේප කරපු එක. මේ අහිමි වීම
එයාගෙ ජීවිතේ කාලෙකට කලින් විනාස කරල
දැම්මා. ඇත්තටම මේක එයාව දවස ගානෙ රිද්දන
මතකයක් වෙලා තිබුණා.

ඩීමෑ

# කඳුලු ගැවුණු මතකයක්

ගැහෙන හදවත මවනවද එක මැකී ගිය රූ පද පෙළක්
කඳුලු මුතුකැට මවනවද එක අමතකව ගිය කතාවක්
සුසුම්වත් යා නොවී තිබුණත් මුල් කිඳා බැසි ප්‍රේමයක්
තියෙනවා සැමදා රිදවනා කඳුලු ගැවුණු මතකයක්

දිලිසෙනා නෙත හදෙහි සිරකර අඳින්නට එක සිතුවමක්
මතකයේ තනුවට ලියන්නට එකම එක නව කවි පෙළක්
නුඹේ රුව නෙත අගෙහි පැටලී අහිමි කරලූ රාත්‍රියක්
ආයෙ ආයෙත් මතක් කෙරුවා කඳුලු ගැවුණු මතකයක්

රහසේම වැටි කඳුලු මිණි කැට සඟවන්න ගත් වැයමක්
මතක සඟවා සිනාසෙන්නට නිතර ගත් උත්සාහයක්
නුඹව දුර සිට බලා මනසින් තුරුළු කර දුන් හාදුවක්
පැරි පැරී හඬනවා නව කඳුලු ගැවුණු මතකයක්

නුඹව සිහිකර මතක අහියස සොයනවා එක කෙළවරක්
මලානික හද වැසුණු දෙනුවන් කරයි කඳුලට ඇරයුමක්
ලොවට පිටු පා නුඹේ වී නුඹ ගැනම ලියනා කවි පෙළක්
හදවතේ ගැඹුරකම සිරකළ කඳුලු ගැවුණු මතකයක්

ඝීළු

මහ රෑ අන්ධකාරයයි හිතේ තිබුණු තනිකමයි පොද වැස්සයි එක්ක
තමන්ගෙ හදවතටම දැනුනු කෙනෙක්ගෙ අහිමි වීම වගේ මතකයක්
කියන්නෙම කොච්චර ලොකු වේදනාවක්ද කියන එක ඒ වගේ අත්දැකීමක්
තියන අයට නම් අමුතුවෙන් කියන්න ඕන නැති තරම්.

අහිමි වෙලා කියල දැන දැනත් හදවතෙන් අයින් කරගන්න බැරි තරමටම
අසරණ වෙන වෙලාවක් ඕනම සටන්කාමියෙක්ට එන්න ඉඩ තියනවා කියන
එක අපේ සමුරායි දැනගෙන හිටපු නැති නිසාමද කොහෙද එයා මේ විදියට
අහිමි වුණු කෙනා වෙනුවෙන් තාමත් හිතේ ඉඩක් වෙන් කරගෙන ඉන්නේ....

ඩීෆ

# අහිමි නුඹ

මතක හදවත් - අදත් කොහෙවත්
රකින රහසත් - නොදැණ මනසත්
කරයි ඔච්චම් - නුඹව අල්ලන්
දියර වන් නෙත - බිම සිඹිනකම්

ඉකි ගසන නෙත - තව නොදැනුවත්
ගැහෙන හදවත - නුඹම සෙව්වත්
නුඹ නොමැත් බැව් - දැණන් සිටියත්
නුඹම සොයමින් - හඬයි තවමත්

ඩී ඵ

මේ වේදනාව සමුරායිට එයාගෙම ජීවිතේ අපායක් කියල හිතෙන තැනට පත් කරල ඉවරයි. එයා එයාගෙම මනසින් ශාපලත් ජීවිතයක ජීවත් වෙන්න පටං අරගෙන කියන එක එයාගෙ බුද්ධිය එයාට කිව්වත් එයාගෙ හදවත එයාව ඒක පිළිගන්නෙ නැති තත්වෙට පත් කරල තිබුණා. හැබැයි මේ කොහොම වුණත් මේ ශාපලත් ජීවිතේ ඇතුලෙදිත් අපේ මේ සමුරායි අර ගැණු ළමයව සැලකුවෙ පරසතු මලක් විදියට. දෙවියන්ගෙ ශ්‍රේෂ්ඨම නිර්මාණ වලින් එකක් කියල සලකන්න තරමටම මෙයා මේ ගැණු ළමයට ආදරේ කළා. අයිතියක් නෑ කියල දැන දැනත් එයා සෑහෙන්න ආදරේ කළා....

ඨී ඛ

# ශාපලත් ජීවිතය

අඹරේ හැමු මල් සුළං රැළි වලට හමු වී පොඩි වුණ
නොදැණ තහනම් කියා විදිනාට සුවඳ මදනළ ගෙන එන
සොයා ආවෙම් කුමන කුසුමද එවා සිටියේ මද නළ
පසුව දුටුවෙම් නෙලා ගනු බැරි ඉසව්වක පිපිලා බව

අත වනයි නුඹ සිනහවක් මද පාව නුඹෙ ඔය මල් පෙති
වදන් ස්වර හද ගාව දැවටෙයි වඩා හැඟුමන් යයි මැකී
හුස්ම ගෙන යන නුඹෙ සිනහව නෙත් අතර විකසිත වීණී
ලියා මගෙ පෙම තබා යම් මම අයිතියක් හින්දා නැති

සියුම් ගී නද නුඹ ගයන විට අසා සිටියත් රහසෙම
අත් අදිනා නුඹ රගන දෙස මම බලා සිටියෙම් හැම්දිනා
අයිති කරගනු නොහැකි හින්දා පූරුවේ කළ පාපෙට
නුඹයි විකසිත කුසුම පරසතු ශාපලත් ජීවිතයක

ශිෆ්‍රු

මේ වගේ සිතුවිලි එක්ක දවස පුරා ජීවත් වෙලාම
එයාගෙ හිතට මේ ගැණු ළමය ගැන දැනෙන දේ
මේ මහ රෑ වැහි පොදේම වචන කරන්න
ඕනෙ කියල එයාට හිතුන. එයා එවෙලෙම
එයා ගාව තිබුණු කෝටු කැල්ලකින්
එයා ඉන්න තැන වැලි තලාව පහුරු ගාන්න
පටං ගත්ත. අමාවක මහ රෑ වැහි පොද
සීතල එක්ක එයාට හිතුණු ලස්සන
වචන ටික වැලි තලාව උඩ ලස්සනට
කවියක් විදියට අපේ මේ සමුරායි කැටයම්
කරගෙන ගියා. හැබැයි කවියෙ අන්තිම
හරියට යද්දි එයාට තේරුණා එකම එක
පදයක් එයාට ගළපගන්න බෑ කියලා.

ඩීෆ

# කවි පදය

සිත මද නළ මතක එළි කර කතාවක් මට කියනවා
වැලි මලුව මත කෝටු අග මට පින්සලක් වී පෙනෙනවා
වර්ණ නැතුවම මතක කැටයම් වැලි පොළොව මත අඳිනවා
මටම නොදැනිම කවි පෙළක් මම වැලි මලුව මත ලියනවා

අමාවක සඳ සොයා දිව ගිය මතක යළි සිහි කරනවා
උමතුවෙන් වගෙ නුඹ ගැනම සිත කාලෙ කවි පද මවනවා
වැලි තලාවම මතක එටිලා අපායක් මෙන් දැඟලනවා
මතකයේ මදහසට සිර වී කවියෙ පදවැල් ගොතනවා

ගෙතූ කවිපද කාලයේ වැලි තලාවෙන් වැසිලා ගිය
සිත අගට වී හද කිති කවයි නෙතු තෙමී යන ලෙසටම
වැලි මතින් ලියවුණු කතාවේ කැටයමට තියනට තිත
බැරිව ලතැවෙයි ගලපාගන්නට කවියෙ අවසන් පේළිය

ලී



මේ කවිය ලිය ලිය ඉද්දි එයාගෙ මතකෙට
අහම්බෙන් වගේ ටිකක් අපැහැදිලි සිතුවිල්ලක්
වගේ දෙයක් දැණුනා. මේ සිතුවිල්ල
තේරුම් ගන්න එයාට එකපාරම බැරි වුණා.
එයාට ඒක විසඳගන්න ලැබුණු අභිරහස් සලකුණක් වගේ....

ලිව

# අභිරහස් සළකුණ

ආයෙ ආයෙම ආපු පාරෙම මදක් දුරකට ඇවිද යනවිට
මගහැරුණු මත කයක් හමුවුණි ආයෙමත් මා රිදවන
හෝඩුවාවක් නොමැති මේ මතකයේ අග මුල ගැන
සොයා යන්නට සිතුණි ආයෙම මහමෙරක් වූ මගෙහිම

හමන මදනළ කනට කොඳුරන අකමැතිම රහසක් වුණා
අමාවක සඳ එළිය නැති බව තරුවකට බැ මකන්න
මකනු රිසි නැති අඳුරු සිතුවම් සඳෙහි අවතැන් නිසාම
පිස්සුවෙන් වගෙ දිව්වා පස්සෙන් අමාවක සඳ සොයන්න

සඳත් බැස ගිය රහස නොකියම තාරකා එළි දිලෙන්න
දළුන වයම දුටුවා නෙතඟින් කරුවලේ මහ අඳුරෙම
සැඟවිලා නටඹුන්ව ගිය එක මතකයක් ගැන සිත සිත
අන්ධකාරෙම තවම යනවා අභිරහස් සළකුණ වෙත

ලීල



මේ විදියට එයාට ඇත්තටම මතක් වුණේ එයාගෙ ළඟ හිටපු
යාලුවො මේ වෙලාවෙදි එයාට උදව් කරපු විදිය. ඒත් මේ සිතුවිල්ල
නම් එයාව එයාගෙ යාලුවන්ගෙන් තවත් ඈත් කරන්න
ආව එකක් වුණා. එයාගෙ කේන්තිය දුක හැමදේම එයාගෙ
යාලුවන්ට දරාගන්න දෙන්න බෑ කියල එයාට හිතෙන්න පටං අරගත්තා.
ඉතින් එයා ටික ටික එයාගෙ යාලුවන්ගෙන් ඈත් වෙන්න තීරණය කළා.
හැබැයි මේ තනිකම එයාට මොනවගේ දෙයක් කරයිද කියල නම්
එයාට හිතාගන්නවත් බැරි වුණා........

# තනිකම

සැඳෑ අහසේ රැගෙන ඉගිලුනු තාරකා එළි වාගෙම
එකට උන් සිටි නැහැනෙ අමතක නමුදු එය අවසන් අද
ප්‍රේමයෙන් කෙලෙසිලා ගිය එක පව්කාර ජීවිතයක
පව් ගෙවන්නට සහය නලුවන් අවැසි නෑ රඟ මඩලට

පිටවෙනා මගෙ හුස්ම හින්දා නතු වේවි පීඩනයට
මතකයට තව අන්ධකාරයෙ ගිලෙන්නට බෑ ආයෙම
සිනහවක් නොමැති මා හට සිනහවක් ගෙන එන අය
නිවී යන තරුවකට ආයෙත් ඕන නෑ ඉකි බිඳින්න

සඳත් නැති තරු වලින් සැඟවුණු අහස ගැන මම දන්නෙ නෑ
දිලෙන තරුවක් නිවී යන්නට තව හුඟක් කාලයක් නෑ
ශුද්ධ වූ නුඹලාගෙ හදවත් පාපයෙන් කෙලෙසන්නෙ නෑ
අඳුරේම සැඟවිලා යනවා නැවත සුසුමක් හෙලනු නෑ

ලිලූ

යාලුවන්ගෙනුත් වෙන් වෙලා තමන්ට තමන් වත් නැතිවෙලා
කර කියා ගන්න දෙයක් නැතුව තනියම ජීවත් වෙන්න පටං
අරගත්ත සමුරායි මේ වෙද්දි ජීවත් වුණේ ජීවිතය මරණයට
වඩා හුස්මක් වගේ ඉස්සරහින් හිටපු නිසා විතරයි.
තමන්ට තමන් ගැනවත් අයිතියක් නැති වෙලාවක
මිනිස්සු තව කෙනෙක් වෙනුවෙන් අයිතිවාසිකම් කියන්නෙ
කොහොමද කියන එක මෙයාට තේරුම් යන්න පටං ගත්තා.
ඒත් ඒ කොහොම වුණත් අයිතියකට ආදරයක් නැති කරන්න
බෑ කියන එක සමුරායිට දැනුනා. අයිතියක් නැතුවමත්
හදවතට ඉඩ දෙන්න පටං ගත්තු සමුරායි මේ ගැණු ළමයා
වෙනුවෙන් ජීවත් වෙන්න තීරණය කළා.....

ලීමා

# අයිතිය

හුරු පුරුදු තැන් එකක් ගානෙම දින පොතේ පිටු පුරා ලිව්වා
අවශේෂ මතකයේ අද්දර කඳුලු වැට වල් ගසා තිබුණා
අයිතියක් නැති හිතක් වෙනුවෙන් මගේ ඉරණම ලියා ආවා
මගෙම මතකය වෙලා අසිපත වර්තමානයෙ පලිහ බින්දා

සන්තකේටම තිබුණු හුස්මත් නුඹේ නාමෙට ලියා තිව්වා
හද ගැහෙන වාරයක් ගානේ මතකයේ අසිපතෙන් ඇන්නා
නුඹේ හිස තිව් මගේ උර මත සිරිච්ච සළකුණක් තිබුණා
ගැලූ දිවි ගඟ අහුරලා නුඹ ආදරේ මහ පවුරු බැන්දා

යන්න යන විට මාව හැරදා සුභ ගමන් බුදු සරණ පැතුවා
දුරට ගොස් නුඹ විද්ද හී සර හදවතේ ධමනියත් බින්දා
යන්න ගිහිනුත් හැරී ඇවිදින් මට අයිතියක් නැහැයි කිව්වා
අයිති නැතුවම මම මගේ හද සදහාටම නුඹ හටම ලිව්වා

ලිව



ඉතින් මේ අයිතියක් නැති හදවත ගැනම හිත හිත
ගෙවන දවස් හැම එකක් ගැනම එයා කල්පනා කළා.
එයා කොච්චර වේදනාවක් විඳිනවද කියල කිව්වොත්
එයා මේ කල්පනා කරන අතරෙම ඇස් දෙක වහගෙන
අහිංසක ප්‍රාර්ථනාවක් කළා.

ලීවු

# ප්‍රාර්ථනාව

පෑව යාමය ගිලී අඳුරක කඳුලු පිණි දිය ඉසිනවාද
ආත්මය බිම බෝ පතක් සේ හුළඟටම වැනෙනවාද
වියළි හදවත් පතිත මේ බිම තවම නුඹ සොයනවාද
අහිමි සඳ මග බලාගෙන ඇති යන්න මට අවසරයිද

රෝස මල් පෙති ඇතිරූ යහනක සැතපෙනව නුඹ දකින්න
දෙණයනම පිං කරල නැතුවැති තාරකාවක් විලසම
බලා සඳ දෙස දවස ගාණෙම මියෙන තරු දෙස බලාන
අයිති නැති බව දැණ දැණත් තරු පෙම් කලා මුළු සඳටම

අහස ගුගුරා වලාකුල් තරයේම කීවත් නිතරම
තරුවකට කිසි වගක් නැහැ තව ඔහේ ඇති සඳ දෙස බලාන
ගොතා ගන්නට බැරිම කවි පද හදවතේ වල දමාන
රහසේම නිවී ලා යනව තරු අහසටත් නොදැණෙනන්නම

වැඩ සිටින දෙව් දේවතාවනි කන්නලව්වක් කරමි මා
සසරෙ එළඹෙන බවයකදිවත් පිළිතුරක් මට දෙයි සිතා
එකම සිතකින් නුඹෙන් අයැදිමි අවසන්ම මේ ප්‍රාර්ථනා
අයිතියක් නැති සඳ ළඟාම හද ආයෙමත් නවතනු එපා

ලීනූ

ඉතින් මේ වෙද්දි නම් මේ මතක ආවර්ජනාව
මෙයාට ලොකු හිසරදයක් වෙලා තිබුණා.
කරපු කියපු දේවල් ආයෙ මේ විදියට මතක්
වෙන එක එයාට දැණුනෙ හරියට අහන් ඉන්න
අමාරු ඝෝෂාකාරී වේදනාත්මක ඔපෙරාවක් වගේ....

ලිෆා

# ඔපෙරාව

රඟහලේ මුල් අසුන් පේළිය වැඩිම මුදලට විකිණිලා
මතක ඔපෙරා ගී අහන්නට මගේ හදවත පෙළඹිලා
ආදරේ ගී ඇහෙද්දීම ශිරා ධමනිත් කකියලා
මතක ආවර්ජනා නාදෙන් හදවතම මගෙ පිනවිලා

ගණන් හෝරා ගෙවී යද්දී කාසියේ පිට පෙරළිලා
සවන් අත්පොළ නතර වී නෙත සෙමින් කඳුළැලි ඉහාලා
මහා ඔපෙරා නාදයම තව හද බිඳිනා තනුවක් වෙලා
වැටෙන කඳුළැලි පිසලන්න බැ දෑත වාරුව ගිහිල්ලා

මුලසුනේ හිඳ කිරුළු පැලඳූ මතකයම නටඹුන් වෙලා
වැළලිලා නිදි වැදී සැඟවුණු තියුණු මතකය ඇහැරිලා
වලකන්න බැඳි බැම්ම බිඳිලා පීඩනේටම නතු වෙලා
මතක විසිරී වේදිකාවම අපායක් මෙන් හැඩිවෙලා

හදවතේ පතුලේ තැබූ නම ඔපෙරාවෙ ගී පද වෙලා
කඳුලු නෙතුවල පුරවලා නුඹෙ මතකයම තනුවක් වෙලා
මකා දැමුවත් ඔපෙරාවෙ පද නැතේ රුධිරය නැවතිලා
තනුව තවමත් වේදිකාවේ වැයෙනවා මා වනසලා

ශා

මේ තරම් වේදනාවල් එක්ක දවසම මේ විදියට
ඔහේ ඇවිද ඇවිද ගත කරන සමුරායිට මේ වෙද්දි
වැස්සට තෙමෙන එක රෑ සීතළ දැනෙන්නෙ නැති
දේවල් වෙලා ඉවරයි.හැබැයි තවම එයාගෙ හිතේ
තිබුණු දේවල් වල කිසිම වෙනසක් තිබුණෙ නෑ.
හැබැයි මොකක් හරි දෙයක් නිසා මෙයාට හිතෙනවා
ආයෙ සැරයක් එයාගෙ යාලුවො ළඟට ගියොත් හොඳයි
කියලා.මේ තිබුණු වේදනාව එක්ක ගෙදරට ගියපු සමුරායි
රෑට පහුවදාම එයාගෙ යාලුවො ගාවට ගියා.
හැබැයි එයාගෙම වැඩ නිසා මේ යාලුකම් කලින් වගේ තිබුණෙ නෑ.
ඒ වුණාට සමුරායිගෙ හිතේ තිබුණු අනිත් හැඟීම් එක්ක
මේ වුණ දේ එයාට දැනුනෙ එයාගෙ යාලුවො එයාව අතෑරල
වගේ දෙයක්.මේ දේවල් එක්ක ඇත්ත තේරුම් ගන්න බැරි
වුණු සමුරායි එයාගෙ ප්‍රශ්න ගිණුමට තව එක ප්‍රශ්නයක්
බැර කරගත්තෙ දුකයි කේන්තියයි දෙකම එක්ක.
ඉතින් මෙයා ආපහු හැරිල එන වෙලාවේදි මෙයාට යාලුවො
වෙනුවෙන් කරපු හැමදේම ලොකු කේන්තියකින් මතක්
වුණා.මේ කේන්තිය නිසා මෙයාට හරියට දැනුනෙ දෙවියන්
ගැන ලොකු විශ්වාසෙකින් හිටපු කෙනෙකුට ඒ විශ්වාසෙ
බිඳුනම දැනෙනව වගේ හැඟීමක්.තව විදියකට කිව්වොත්
අදේවවාදී හැඟීමක්......

# අදේවවාදියා

සොයා වරමක් කන්නලව් කළ දේව් ගැති හදවතක් දුටුවා
දවස ගානෙම පුදා මල් පැන් දෙවියන්ට පිං වඩා තිබුණා
ඒ පිනෙන් බොහො කාලයක් නුඹ නිරෝගී සුව ලබා සිටියා
රහසේම පිං කෙරූ හදකට අකුණු සැරයක් කඩා වැටුණා

කෙරූ පිංකම් පාපයක් වී මැවි මැවී මගෙ හදට දැනුණා
දෙවිවරුන් සිටියේම පිනටයි කියා මගෙ සිත කියා සිටියා
කන්නලව් නෑහුණා වාගේ ඔවුන් අහකට වෙලා උන්නා
සිත් දෙවොල වී වංකගිරියක් අතරමග මා තනිව හැරියා

එපා රැදෙනට දෙවිවරුන් මත මගේ සිත නිතරෝම කීවා
අහන්නැතිවම දුන්න පිං මම අපායක් නෙතු අගම මැවුවා
නැති වේවි යැයි සිතූ දේවල් සාහනයක් සේ මැවී පෙනුණා
පිදූ දෙවිවරු ඉවත යනු දුටු විට්දි මගෙ නෙතු හැඩා වැටුණා

එපා රුව වී පිටුපාන්නට වේවි දෙවියන් කෝප කීව්වා
කරපු පිං අපරාදෙ කලකට පසුව හදවත කියා සිටියා
වෛරයක් නැතිමුත් සිතට මහ කලකිරීමක් දැනී තිබුණා
මතක අසිපත දේව් ගැති සිත මටත් රහසෙම මරා දැම්මා

කුශල

මේ වුණු දේත් එක්ක කේන්තිය වේදනාව එයාගෙ හිත පුරාම වේගෙන් පැතිරුණා. මතකයන් වලින් වේදනා විඳපු එයාට එයාගෙ ශරීරය ඇතුලෙ අක්‍රිය වෙලා තිබුණු ගිණි කන්දක් සක්‍රිය වුණා වගේ හැඟීමක් දැනෙන්න පටං ගත්තා. පොඩි වෙලාවක් යද්දි සම්පූර්ණ ශරීරයම ගින්දරට යට වෙනවා වගේ එයා එයාගෙම වේදනාවෙන් පිච්චෙන්න පටං ගත්තා. හැබැයි ඒ කොහොම වුණත් එයා මේ හැමදේම දරාගෙන වේදනාව කාටවත් පෙන්නන්නෙ නැතුව තනියම ආපහු එන්න හැරුණා. මේ ගිණි කන්ද එයාව ටික ටික දේවල් දරාගන්න හුරුකරයි කියන පොඩි විශ්වාසයක් එයාට දැනිල තිබුණොත් ඒ නිසාමයි.

# ගිණී කන්ද

මතක ගිණි ගෙන දැවී නොමියෙන
සිහින වල දැවටිලා ආයම
නිදි දොරටු රහසේම විවර කර
තබා ගිණි මගෙ හදෙහි කොණකම

අනවසර නෙතු කඳුලු දී මට
හිසරුදා පණ නගා රහසෙම
මියෙන තුරු විදවන්න මග බලාන
පියාපත් නැහැවේවි ලෝ දියෙන්ම

පියඹනා විහඟුන් ගේම ගානට
මහ බරක් ගෙන සැරි සරන්නට
ගිණිකන්ද හද තබාගෙන මම
සිටිම් අක්‍රිය වෙලා වගෙම

ශශාලු

මේ හිතේ අවුලත් එක්ක ආපහු යන්න
හැරුණු මේ සමුරායි, ටික දුරක් යනකන්
එක හුස්මටම වගේ ගියත් එයාට ඒ විදියට
වැඩි දුරක් යන්න බැරි වුණා. දවස් ගානක්
මේ විදියට ගෙවිල ගියපු නිසා එයාට
යන අතරමැදදි මහන්සිය නිවාගන්න
ටික වෙලාවක් නැවතිලා යන්න ඕන වුණා.
ළඟම තිබුණු බංකුවක වාඩි වුණු අපේ
සමුරායි, මෙ තැන තිබුණු සුන්දරත්වය
ටිකක් විඳින්න ගත්තා. එයා කලින් වගේ
නොවුණත්, ආයෙමත් පරණ මතකයන් ටිකට
අවස්තාව දුන්නා. හැබැයි මේ වතාවෙ
එයාට දැණුනෙ මේ එයා එයාටම කරන
පාපොච්චාරණයක් විදිහට........

# පාපොච්චාරණය

ගවු ගණන් දුර අත ගිය සිත මටත් රහසෙම තනියම
මතක ගොන්නක් ඇහිඳගෙන එයි මාව රිද්දන නිතරම
එකින් එක කියවා බලන්නෙමි තත්පරෙන් තත්පරයම
මගෙම අධිකරණය ඇතුළෙ සිත නඩු අසයි අද මගෙනම්

විත්ති කූඩුවෙ මතක අතරා සිටන් ඉන්නත් බැරි ලෙස
මතක එකිනෙක කඳුලු වී එයි විනිසුරුගෙ නෙත අභියස
මගෙම සිත තුළ වරදකරු වී ගෙවෙන මේ මහ අඳුරට
කරුණු විමසන හදට හැකිවෙද යුක්තියට අත වනන්න

විනිසුරුගෙ මහ හඬත් නවතියි කරුණු විමසා සිටියම
ජූරියෙත් නෙත කඳුලු පිරිලා මගේ පාපොච්චාරණේට
පෑන් තුඩ නලියනවා දැක දැක ගැස්සෙනව මගෙ හදවත
උතුම් භූමිය කිළිටි කෙරුවට දඬුවමත් මරණයමද

වරම් ලැබ මම ගත්ත දිවි මග පිහිතුඩෙන් කෙළවර කර
දුන් තීන්දුව පිළිගනිමි මම කඳුලු දෙවරක් පිසලම
රිදෙන මතකය නිම් වූ පිහිතුඩ මගේ ගෙල වෙත ළං කර
හුස්ම බිඳුවත් මගේ අන්තිම හෙලා දැමුවෙමි රහසෙම

ජාලු

මේ පාපොච්චාරණය එයාගෙ මතකයේ තිබුණු හැම පොඩි දෙයක්ම ආයෙත් මතක් කරා. හැබැයි මේ වතාවෙ වේදනාවකට වඩා වෙනස් විදියෙ හැඟීමක එයා හිරවුණා. දිගින් දිගටම එයා කල්පනා කලා එයාට දැනෙන මේ හැඟීම ගැන. හැමදාම මතකය එක්ක යුද්ධ කරල පරාද වුණු අපේ සමුරායිට පළවෙනි වතාවට මතකයට එරෙහි වෙන්න හිතුණා. එයාට එයාගෙන්ම එයාව ගලවගන්න යුද්ධ කරන්න ඕන වුණා. ඉතින් කල්පනා කරලා කරලා එයා අවසානයෙදි එයාගෙ ජීවිතේට සමුදෙන්න තීරණය කළා. හැබැයි හුස්ම විතරක් නවතින සියදිවි නසා ගැනීමක් වෙනුවට කාල රාමුවටම අභියෝග කරන්න එයා තීරණය කළා.

# සියදිවි නසාගැනීම

හිරු අවරහිඳ බලා අඳුරුම කලාවට අත වනාලා
පාට ගිලිහුණු පින්සලක් ගෙන මන බඳිනා කැටයම් යොදා
අතීතයෙ මතකයෝ සෑයක වර්තමානය ගිණි තියා
සෑයෙ අළු මත සර්පිනා දෙයි අනාගතෙ මගෙ ඉකිගසා

මගෙම අළු මත ඇවිද යනවා මතක රාමුත් පිරලා
අහස් ගව්වෙ චිත්‍ර ඇඳලා වලාකල් මගෙ තිර වෙලා
පුරන් වී ගිය මතක අද්දර දැළවෙන මගෙ ගත සොයාලා
ඉසින්නෙම් පැන් පොදක් දියකර මතක ගිණි කඳු නිවාලා

සිහි නැගෙන විට කරපු පව් කඳ සිහින මෙන් මහ රෑ පුරා
හුස්ම නවතයි ගතින් වෙන්වුණු ආත්මය මගෙ ඉකි ගසා
ලියුම් කඩදහි පේළි අන්තිම ලියන්නෙම් අත්සන් යොදා
තබම් කෙළවර නැවතුමේ තිත මතකයෙන් සියදිවි නසා

ශෂූ

කාලය, මතකය වගේ දේවල් එක්ක පොර බදින ගමන් ඉද්දි වටපිටාව එයාට ලොකු හයියක් වෙලා තිබුණා. මොකද මේ වෙද්දි ටෝකියෝව වසන්ත කාලෙට ගොඩක් කිට්ටු වෙලා තිබුණා. කොළපාට පිරුණු ගස් වල හෙවන යට ඉද්දි දැනෙන සීතල විඳින ගමන් ටික ටික මතක ලෝකෙ ඇතුලෙ කලින් දැකපු නැති විදියට එයාගෙ මතකයන් එක්ක සැරි සරන්න පටං ගත්තා. කොහොමහරි මේ විදියට වටපිට බලන ගමන් ඉද්දි එයා ඉන්න බංකුවෙ එහාපැත්තෙ කෙළවරට හාගෙට පරවුණු මලක් හුළඟත් එක්ක කඩාගෙන වැටුණා. එයාට හිතුණා එයාගෙ ජීවිතේට වුණෙත් මේ වගේ දෙයක්ම නේද කියලා....

# බංකුවේ කෙළවර

මන්දාරමේ අඳුර මැද්දේ හමන සුළඟට ලෙලදෙන
අනවසර හිරි පොදෙන් නැහැ වී තෙමෙයි දවසක් ගානෙම
පිපුණු අරලිය මලක් සුළඟට පතිත වී බංකුව මත
පරව යන බව නොසිත විහිදයි සුවඳ සුළඟට මුසුකර

බඹරකැන් ඔහුගේ අවසරෙන් බොන්න ඇති මල් පැන් උරා
පරාගණයට රොන් හලන්නැති කාටවත් ඔහු නොපවසා
බිලිවෙන්න ඇති සැඩ සුළඟකට රැකගන්න තව අරලියා
රැකගන්න බැරි වෙලා යන්නැති රොන් ගොඩක් හලලා නිසා

පණ පුදා රැක ගන්න හැදුවත් වලක් නැති බව වැටහිලා
දේව් ඇරයුම් ලබා සිටියත් යන්න නැතුවැති පරවෙලා
විඳව විඳවා සුවඳ ගිලිහී යන තෙක්ම හිඳිනව බලා
බංකුවේ කෙළවර පරවෙනව එක පිරිමි කුසුමක් මියැදිලා

ශී

මේ විදියට හිත හයිය කරගෙන එයාගෙ අතීතෙට මූහුණ
දෙන්න තීරණය කරපු වෙලාවෙම එයාගේ හදවතින්
එයාට කතා කරනවා වගේ දෙයක් දැණුනා. මතක එක්ක
අනන්තය කිට්ටුවටම ගිහිල්ලා හිටපු සමුරායිට දැණුනෙ
මේ එයාට සෑහෙන කාලෙකට කලින් අනන්තයෙන් ආව
පණිවිඩයක් කියලා. එයා හිත හයිය කරගෙන අනන්තයේ
මේ ආව රහසට ඇහුම්කන් දෙන්න තීරණය කළා.

ශිෆ

# අනන්තයෙන් රහසක්

මතක වර්ෂා කඩා හැලෙනා රැයේ අඳුරැම කලාවේ
අනන්තෙක සිත නතර වී ලය තෙත් වෙන්න ඉගි කරාවේ
නිදි නොමැති රෑ ඇස් පනාපිට සිහින බිදෙනා වෙලාවේ
අනන්තය කොඳුරනා රහසක් සවන් ගැටෙනා යාමයේ

සිහින සිතුවම් මතක පදවැල් ගෙතෙන මේ රෑ යාමයේ
මතක තුන්දොර එකම යහනක මාව තනිකළ වෙලාවේ
කිම්ද පාවෙන මතක නටඹුන් තනිව හඩනා යාමයේ
අතැර යන්නට අනන්තෙන් ආ ඇරයුමක් ලද වෙලාවේ

දරන්නට බැරි අසිරුම පිටු පෙරලෙනා මතකයෙ පොත
සගවන්න හැකි වේද නොදැනීම කල්පනාවක සිරවුණා
අතහරින්නට කියා දෙසවන තෙමා සිටි මේ රාත්‍රිය
අනන්තය ළග මතක තනිකර කලාදෝ මා අසරණ

රිදෙන තැන් වල මතක පදවැල් අනන්තයකට කිව් ලියා
අතහරින්නට බැරිම තැන් ගැන අනන්තයටම පැවසුවා
බිඳුණු හදවත අනන්තය ළග මතක පදවැල් ලියාලා,
අනන්තයටම පේම් කළෙම් ඇස් හැරගෙනම නිදි වරාලා,

ශීල

අනන්තය කියපු රහසත් එක්ක එයාට බලාපොරොත්තු බිඳ වැටීමක් වුණා වගේ දැණුනා. ආයෙමත් මෙයාට හිතට අමුතු කලකිරීමක හැඟීමක් දැනෙන්න පටං ගත්තා. මතක එක්ක තනියම සටන් කරන එක හිතුවට වඩා අමාරු දෙයක් කියලා එයාට දැණුනා. මේ එපාවුණු හැඟීමත් එක්ක ඉද්දි එයා බලාපොරොත්තු නොවුණු සිනිඳු ස්පර්ශයක් එයාට දැනුනා. එකපාරටම කලබල වෙලා බලද්දි එයා ලස්සනම ලස්සන ඇස් දෙකක් දැක්කා. එයාගෙ කනට ඇහුණු වචන වගේම ඒ ඇස් දෙකත් පළවෙනි පාරට හම්බවුණු දේවල් නෙමේ කියලා මෙයාට තේරුම් යන්න ලොකු වෙලාවක් ගියෙ නෑ.

වැඩි ආශ්‍රයක් නොතිබ්බ ඒත් දන්න කියන කෙනෙක් නොහිතපු වෙලාවක ආව එක සමුරායිට අලුත් බලාපොරොත්තුවක් දුන්නා. එයාට මේ යෙහෙලියව දැණුනෙ හරියටම ටෝකියෝවටම වසන්තය එද්දි පිපෙන පළවෙනි සකුරා මල වගේමයි....

# සකුරා

මතක ගිණිදැල් අතර ඇති උන් හැරදමා ගිය ආයුධ
හදවතේ ලේ බිංදු අතරේ හැංගිලා බිම් බෝම්බ
සාමකාමී ජපානය වන් තිබූ මගෙ හද මඩලම
වැනසිලා උන් වලදමා ගිය උණ්ඩ කොපුවල බයටම

යුධ බියෙන් ඇවිලෙණා හදවත පිණි දියෙන් නහවන්නට
දිරා ගිය රුක් ලතා ආයෙත් වල දරයි යුධ ගිණි මැද
වාසනාවේ පණිවිඩය දෝ අරන් පිපුණේ හනිකට
රෝස පෙති වල ලියා ආවද හිරොෂිමාවේ ඉරණම

යනෙන සෙබලුන් දකින විටදිත් බයයි දැනුන්නම් හදවත
රෝස පෙති නුඹෙ දකින විටදිත් දැණෙයි සිසිලක් මනසට
ගිණිබත්වී මියැදෙණා හදවත හිරොෂිමාවත් පරදණා
නුඹයි සකුරා නිවා දැමුවේ ටෝකියෝවේ හදවත

ටෞ

ඉතින් අපේ මේ සමුරායි තමන් ගෙවපු කාලය ගැන මතකයෙන් විඳවද්දි, රැයක් දවාලක් ගැන අවබෝධයක් නැතුව ඔහේ කාලය ගෙවද්දි, අහම්බෙන් පිපුණු මේ සකුරා මල වගේ යෙහෙලිය එයාගෙ ජීවිතේට වාසනාව අරගෙන එයි කියලා ලොකු බලාපොරොත්තුවක්  හිතේ තියාගත්තා...

මේ බලාපොරොත්තුව මෙයාට මෙයා ඉන්න තැනින් නැගිටින්න මෙයාට උදව් වුණත් ඇත්තටම මේ සමුරායිට ආපහු පරණ තත්වෙට යන්න පුළුවන් වෙයිද? එයාගෙ දරුණු මතකය එයාව ලේසියෙන් අත්හරියිද? එයාගෙ යාළුවො ගැන එයා හිටපු වැරදි අවබෝධයත් එක්ක මෙතනින් ඉස්සරයට මොනවා වෙයිද මේ සකුරා මලට ඇත්තටම මේ භාගෙට මැරුණු ජීවිතයට ආයෙමත් පණ දෙන්න පුළුවන් වෙයිද?

ශිමා


මතු සම්බන්දයි....



# සකුරා

යනු, සාහිත්‍ය නිර්මාණයකින් එපිට සීමාවක සිට නිර්මාණය වූ යතාර්ථයකි. එය එක් කාව්‍ය නිර්මාණයකින් හෝ එක් කෘතියකින් කිසිසේත්ම අවසන් නොවේ. සෑම මොහොතකම හැකි උපරිම ලෙස යතාර්ථය එත්තු ගැන්වීමට ගත් ප්‍රයත්නයක් ලෙස සකුරා හැඳින්විය හැකිය. යතාර්ථයට අවසානයක් නොමැත. සදාකාලික පැවැත්මකට උරුමකම් කියන යතාර්ථයෙන්, ඉතාමත් සුළු ප්‍රමාණයක් සකුරා පළමු පරිච්ඡේදය තුළින් සමීප කරවීමට උත්සහ කරන ලදි.
සමුරායිගෙ ජීවිතයේ එක් පරිච්ඡේදයක් මෙලෙසින් අවසන් වූවද
එම අවසානයම නව පරිච්ඡේදයකට මුල පුරා ඇත.
යතාර්ථයේ මීළඟ පරිච්ඡේදය සමගින් හමුවන තුරු
සකුරාවට පෙම් බැඳි යතාර්ථයේ සාක්ෂ්‍ය කරුවනි,
බොහොම ස්තූතියි........